# පුරාවස්තු සුරැකීමට සන්නිවේදන ජාලයක අවශ්‍යතාව

ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාඥයන්ගේ සංගමයේ සාමාජික
**සිරිසමන් විජේතුංග**

කෙනෙකු තවත් කෙනෙකුගෙන් වෙන් කර අප හඳින ගන්නේ ශරීරයේ කුමන කොටස නිසා ද යන්න ඔබ මට ඉහත සිතා බැලුවේ ද. එය ඔබ මේ මොහොත වනතුරු සිතා නොබැලුවේ නම් ඒ සඳහා සිතා බැලීමට මේ යුගයේ ඉතාම සුදුසු කාලය අද එළඹ ඇත. කෙනෙකු ගේ අත - පය හෝ ශරීරයේ වෙනත් කුමන අංගයක් තුළින් වුව ද පුද්ගලයකු හඳුනා ගැනීමට හැකිවන්නේ නැත. කෙනෙකු ගේ මුහුණ හැඳුනුම්පත සඳහා යොදගන්නේ මේ නිසා ය. මේ නිසා ජාතියක ද මුහුණ ලෙසින් සැලකිය හැක්කේ පරපුරින් පරපුරට රැකගෙන ආ පුරාවස්තුන් ය.

කෙනෙකුගේ මුහුණ විරූපී වුවහොත් ඔහු කවරෙක් ද යන්න හඳුනා ගැනීමට අපහසු වන බව ඔබට අමුතුවෙන් ප්‍රකාශ කළයුතු කරුණක් නොවේ.

අද අප මුහුණ පා සිටින සමස්ත ජාතිය මුහුණ පා සිටින ඉතාමත් දරුණු අභියෝගයක් නම් උතුරේ හා නැගෙනහිර පවතින එල්. ටී. ටී. ඊ. සංවිධානය විසින් එල්ල කරනු ලබන ගරිල්ලා සටන බව අමුතුවෙන් සඳහන් කළ යුතු කරුණක් නොවේ. ඊට දෙවැනි නොවන තවත් අභියෝගයක් අප ඉදිරිපිට අද පවතී. එය ජාතියේ මුහුණුවර වෙනස් කිරීමට කරනු ලබන පුරාවස්තු විනාශ කිරීම හා පුරාවස්තු සොරකම් කිරීමයි.



ක්‍රි. ව. 7, 8 සියවස් – අනුරපුර ලෝකඩ බෝධිසත්ව ප්‍රතිමාව



ක්‍රි. ව. 12 සියවස – පොළොන්නරුව ලෝකඩ පාර්වතී පිළිමය

බුදු සිරසට පහරදී කඩා බිඳ දැමීම මගින් ඒ පුරාවස්තු විනාශ කරන්නන් විසින් කරන්නේ ද ජාතියේ මුහුණුවර විකෘති කිරීමකි. මුරගලක් ගලවා දැමීම එය සොරකම් කිරීම හෝ වෙනත් පුරාවස්තුවක් ඉවතට ඇද දැමීම සොරකම් කිරීම කඩා බිඳ දැමීම යන මේ සියලු දෙයින් ම සිදුවන්නේ ජාතියේ මුහුණ ජාතියේ මුහුණුවර වෙනස් කිරීමට උත්සහ කිරීමයි. මෙය මේ යුගයේ ඉතාමත් දරුණු ඛේදවාචකයකි. පසුගිය කාලයේ දී ඉතා ශීඝ්‍ර අන්දමින් මේ පුරාවස්තු කොල්ලය පැතිරී ගෙන යන්නට පටන් ගත්තේ ය.

ජාතියේ මුහුණුවර වෙනස් කිරීම තුළින් ඔවුන් අපේක්ෂා කරන්නේ වසර දෙදහස් පන්සියයකට වඩා ඈත අතීත ජන උරුමයක් ඇති මේ ශ්‍රී ලාංකික අනන්‍යතාව හඳුනාගැනීම විනාශ කිරීමයි.

මෙය එක්තරා පිරිසකගේ මුග්ධ ක්‍රියාවක් ලෙසින් ඇතැම් විටෙක කළ යුතු කරුණක් නොවන්නේ ම ය. අපගේ නිවසේ ඇති ගෘහ භාණ්ඩ මෙන් ම අපගේ ජීවිතයට එදිනෙදා අවශ්‍ය දේ අප ආරක්ෂා කිරීමට කිසියම් අවධානයක් යොමු කරවන්නේ ද ඒ හා සමානවම අවධානයක් සමස්ත ජාතියටම අයත් වන පුරාවස්තු ද සුරැකීමට

දැක ගැනීමට හැකිවී ඇත. මේ තත්ත්වය හමුවේ අද අප රටේ වෙහෙර විහාර පමණක් නොව නවමත් වනයට යට වී ඇති පූර්ණ ස්ථානය ද විනාශයට පත් කිරීමට පටන් ගෙන ඇත.

රාජ්‍ය අංශය විසින් විවිධ ක්‍රියාමාර්ග පුරාවස්තු විනාශ කරන්නන්ට එරෙහිව කරගෙන යනු ලැබේ.

රාජ්‍ය අංශය විසින් පමණක් ම මේවා ආරක්ෂා කිරීමට විධිවිධාන යෙදීම ප්‍රමාණවත් නොවන බව අප අමතක

අපට අද සිදුවී ඇත. මේ නිසා රාජ්‍ය අංශය මගින් විශේෂයෙන් ම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවත් රටේ ආරක්ෂක අංශය හා කරන අධිකරණ ශාලා මගින් ද මේ අතීත ජන උරුමය විනාශ කරන පිරිසට එරෙහිව එකාවන්ව ක්‍රියා කළ යුතු කාලය එළඹ ඇත. එයට තවමත් ප්‍රමාද නැත.

මේ සඳහා සමාජ වගකීම ගැන අප මෙහිදී මදක් විමසා බලමු. ඉහත සඳහන් කළ ආකාරයට කෙනෙකු ගේ මුහුණ ආරක්ෂා කිරීමට තම් මුහුණ පමණක්ම නොව ඒ පුද්ගලයාට අයත් සමස්ත ශරීරය ම ආරක්ෂා කළ යුතු වන්නේ ය. ඊට හේතුව මුහුණද ශරීරයේ ඉතාම වැදගත් කොටසක් වන හෙයිනි.

අද සමස්ත ජාතියම රෝගී භාවයට පත්වී ඇත. මේ සඳහා විවෘත ආර්ථිකයට දෙස් තැබිය හැකි ය. නැතහොත් මෙතෙක් පැවැති රජයන්ට කෙනෙකුට දෙස් තැබිය හැකි ය. අධ්‍යාපන ක්‍රමයට දෙස් තැබිය හැකි ය. මේ කිසිවක් මේ සඳහා පිළියම් නොවන්නේ ය. මේ සඳහා මූලික පිළියම වන්නේ මේ අගනා අතීත ජන උරුමය පිළිබඳ අප විසින් අවබෝධ කර ගැනීම ය. ඒ අතීත ජන උරුමය ගැන අවබෝධයක් ලබා ගැනීම හා ඒ අවබෝධය ලබාදීම තුන් ආකාරයකින් කළ යුතුව ඇත.

(1) අනාගත පුරවැසියන් වූ ළමා පරපුරට අප රටේ අතීත ජන උරුමය පිළිබඳ අවබෝධයක් ලබාදිය යුතු ය.

(2) මේ යුගයේ ජීවත්වන වැඩිහිටි පරපුරට මේ පිළිබඳ අවබෝධයක් ලබාදීම

(3) මේ රටේ සිටින තරුණ පරපුරට ඊළඟට අප රටේ අතීත ජන උරුමය පිළිබඳ අවබෝධය ලබාදීම

මේ අවබෝධය ලබාදීම ඉතා ක්ෂණිකව කළ යුතු කාර්යයකි.

මේ අනුව ළමා, තරුණ හා වැඩිහිටි යන ජන කණ්ඩායම් තුන කෙරෙහි අප රටේ පොදු ජන උරුමය පිළිබඳ කිසියම් අවබෝධයක් ලබාදීමේ වැඩපිළිවෙලක් වහාම ක්‍රියාත්මක කළ යුතුව ඇත.

මෙම අංශ තුනින් ඉතා ක්ෂණිකවම අවබෝධයක් ලබාදීමේ වැඩපිළිවෙල දියත් කළයුත්තේ වැඩිහිටි පරපුරට හා තරුණ පරපුරට ය. ඊට හේතුව එම ජන කොටස් දෙක සමාජය තුළ ක්‍රියාකාරී පුද්ගලයින්ගෙන් සමන්විත වන හෙයිනි. එම ක්‍රියාකාරී භාවය තරුණ පරපුර තුළ ඉතාමත් දැඩි බව මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණකි.

පුරාවස්තු විනාශ කිරීමේ කාර්යයට සම්බන්ධ වන පුද්ගලයින් පිළිබඳ හැදෑරීමේදී ඔවුන් වැඩි දෙනෙකු තරුණ හා වැඩිහිටි යන අංශ දෙකට අයත් වූ බව මෙතෙක් සිදුකර ඇති ඒ පිළිබඳ විනාශයන් අනුව පැහැදිලි වන කරුණක් වන්නේ ය.

මේ නිසා මූලික වශයෙන් මෙම පුරාවස්තු විනාශ කිරීමේ ස්වභාවය තේරුම් ගෙන ඒ සඳහා දැඩි දඬුවම් ලබාදීමේ වැඩ පිළිවෙලක් දැනටමත් නීති රීති මගින් විශේෂයෙන් පුරාවිද්‍යා ආඥා පනත සංශෝධනය කිරීමෙන් සිදුකර ඇත.

ඒ අනුව පුරාවස්තු කොල්ල කෑමට හෝ සොරකම් කිරීමට හෝ විනාශ කිරීමට සම්බන්ධ වූ කුමන පුද්ගලයකුට වුවද ඇපදීම හෝ ඇපමත මුදා හැරීමක් නැත. ඔවුන් අල්ලා ගැනීමෙන් පසුව කෙලින් ම ඔවුන් අල්ලා අධිකරණය හමුවට පත් කරනු ඇත.


එසේ චෝදනා ලබන වූදිතයින්ට වසර දෙකක සිට වසර පහ දක්වා බරපතල වැඩ ඇතිව සිර දඬුවම් හෝ රුපියල් පනස් දහසක දඩයක් යන දෙකම හෝ එයින් එකක් අධිකරණය මගින් ලබා දෙනු ඇත. මෙම දඩ මුදල වැඩි කිරීම කෙරෙහි දැනට සලකා බලා ගෙන යනු ලැබේ.

අප නැවතත් ඉහත සඳහන් කරන ලද ජන කණ්ඩායම් තුන පිළිබඳ අවධානය යොමු කරවුව හොත් විශේෂයෙන් ම පළමුව තරුණ හා වැඩිහිටි පරපුර සඳහා ඉතා කෙටිකාලීන වැඩසටහන් මගින් ඔවුන්ට අප රටේ ජන උරුමය පිළිබඳ අවබෝධයක් ලබාදීමේ කාර්යය ඉටු කළ යුතුව ඇත.

දෙවැනිව, ළමා පරපුරට මේ පිළිබඳ අවබෝධයක් (ජන උරුමය පිළිබඳ) ලබාදීමේ දීර්ඝ කාලීන වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුව ඇත. මෙය කළ යුත්තේ හා කළ හැක්කේ කෙසේද යන කරුණ පිළිබඳව අප රටේ සැලසුම් ක්‍රියාත්මක කරවන රාජ්‍ය අංශය විසින් සිතා බැලිය යුතු කාලය අද උදාවී ඇත. සමස්තයක් ලෙසින් ගත් කල්හි මෙය පුරාවස්තු ආඥාපනත මගින් පූර්ණ බලතල ලබාදී ඇති පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වැනි ඒකල රාජ්‍ය ආයතනයකට පමණක් කිසිසේත්ම ක්‍රියාත්මක කළ හැක්කක් නම් නොවේ.

ඉහත සඳහන් කළ ළමා, තරුණ හා වැඩිහිටි යන ජන කණ්ඩායම් තුන සඳහා කෙටිකාලීන මෙන් ම දිගුකාලීනව අප රටේ ජන උරුමය පිළිබඳ අවබෝධයක් ලබා දීමේ වැඩ පිළිවෙල මේ නිසා සමස්ත සමාජය පුරාම වැළඳගත් වැඩසටහනක් විය යුතුව ඇත. එසේ නොවන්නේ නම් එය 'පය බරවායට පිටිකර බෙහෙත් බඳනා සේ' යනුවෙන් සද්ධර්ම රත්නාවලිය ලියූ ධර්මසේන හිමියන් ගේ ප්‍රස්ථාව පිරුළ අපට මතක් කර දෙනු ඇත.

පළමුකොට අප පුරාවස්තු විනාශ කිරීමේ ආදීනව පිළිබඳ අවබෝධයක් ලබාදීම සමස්ත වැඩසටහන තුළින් ම ක්‍රියාත්මක කළ යුතුව ඇත. මේ සඳහා කෙටිකාලීන වැඩසටහන් මගින් ජනතාව දැනුවත් කිරීම පිණිස ජන මාධ්‍යයන් යොදා ගැනීමේ අවශ්‍යතාව මතු වී ඇත. 'අද පාරිභෝගික භාණ්ඩ අලෙවිය සඳහා සන්නිවේදන මාධ්‍යයන් ඉතා බහුල ලෙසින් යොදාගන්නවා ඇත. පුද්ගලයකුට අවශ්‍ය අත්‍යාවශ්‍ය භාණ්ඩ පිළිබඳව නම් එතරම් ප්‍රචාරයක් අවශ්‍ය නොවේ. අද භාණ්ඩ හා සේවා පිළිබඳ ප්‍රචාරය තුළින් පුද්ගලයින් තුළ ඒ භාණ්ඩවලට ඉල්ලුමක් ලබා ගැනීම නැතහොත් පාරිභෝගිකයා තුළ අවශ්‍යතාවක් පැටවීම සිදු කෙරේ. මේ භාණ්ඩ ලබා ගැනීමට බොහෝ දෙනෙකුට වත්කමක් නැත. ඒ පිරිස අතරේ අප රටේ අතීත ජන උරුමය පිළිබඳ අවබෝධයක් නැති



ක්‍රි. ව. 12 සියවස – හිටි බුදුපිළිමය, ගල්විහාරය පොළොන්නරුව



ක්‍රි. ව. 18 සියවස – රිදී විහාරය ඇත්දළ කැටයමක් (කුරුණෑගල)

අනලොස්සක් පිරිස විසින් මේ පුරාවස්තු විනාශය සිදු කරන බව ද රහසක් නොවේ.'

ඊට අමතරව සංවිධානාත්මකව පුරාවස්තු සොරකම් කරන පිරිසක් ද අප අතර සිටින බවට දැනට ආරක්ෂක අංශ මගින් සොයා ගෙන ඇත.

රටේ සියලුම පිරිස සඳහා ජනමාධ්‍ය මගින් සන්නිවේදන ජාලයක් මගින් ජනතාව දැනුවත් කිරීමේ කාර්යය පුරාවිද්‍යා ක්ෂේත්‍රයට අදාළ රාජ්‍ය ආයතන මගින් පමණක් නොව මේ සඳහා සබඳතාවක් ඇති අනෙකුත් රාජ්‍ය ආයතන ප්‍රමුඛ කොට ගත් පෞද්ගලික සංවිධාන ද ක්‍රියාත්මක විය 'යුතු මොහොතක අප අද සිටින බව අමතක කළ යුතු නොවන්නේ ය.

මේ සන්නිවේදන ජාලය සමාජය තුළ බලපෑම් කරන ආකාරය කළ හැක්කේ කෙසේ ද? අද තරම් සන්නිවේදන මාධ්‍ය දියුණු තාක්ෂණය හා බැඳුණු යුගයක් එද දක්නට නොලැබුණත් එද අප රටේ මෙම පුරාවස්තු පමණක් නොව ඒවා පිහිටි ගම්බිම් පවා රැක ගැනීමට හැකි වූයේ ද කිසියම් සන්නිවේදන රටාවක් එකල සමස්ත සමාජය පුරාම පැතිරී තිබුණු නිසා ය. එයින් ප්‍රථම සන්නිවේදන ස්වරූපය 'වාචික හා රූප' සන්නිවේදනය යි. දෙවැන්න ලිඛිත සන්නිවේදනය යි.

මෙයින් පොදු ජනතාව සඳහා වාචික හා රූප සන්නිවේදන මධ්‍යස්ථාන අද මෙන් එද ගුවන් විදුලි හෝ රූපවාහිනී මධ්‍යස්ථාන නො තිබුණු නමුදු එම කාර්යය ඉතා මැනවින් ඉටු කලේ පන්සලෙනි. ධර්මාසනය මත වැඩ හිඳ දෙසනු ලබන ධර්මදේශනා ශ්‍රවණය කිරීම බාල, තරුණ, මහලු යන තුන් ජන කොටසට ම අදාළ වූයේ ය.

රූප මගින් මේ සන්නිවේදනය ද පන්සල මධ්‍යස්ථානය කොට සිදු වූයේ ය. අපේ පැරණි චිත්‍ර වලින් ද මූර්ති වලින් ද සිදු කලේ මෙම සන්නිවේදනයයි. ඒවා අද අපේ පැරණි ජන උරුමයක් බවට පත්වී ඇත.

ඒ ජන උරුමයන් අද ක්‍රියාකාරී වශයෙන් කිසියම් ප්‍රබල සන්නිවේදන කාර්යයක් ඉටු නොකළත් ඒවා තුළ අපගේ ජාතික මුහුණුවර රැකී ඇති නිසා එම පුරාවස්තු රැක ගැනීම අපගේ පරම යුතුකමක් වන්නේ ය.

විශේෂයෙන් ම මෙහිදී පැරණි රජවරුන් හට ජන කණ්ඩායම් විසින් ගොඩනගන ලද ආරාම, විහාර, දාගැබ්, බුදුපිළිම, චිත්‍ර, මූර්ති පිළිබඳව දීප වංසය, මහා වංසය, ථූප වංසය, බෝධි වංසය ආදී අපේ වංස කතා වල සඳහන් වෙයි. මේ පිළිබඳව විමසන විට ධාතුසේන රජුගේ රාජ්‍ය කාලයේ දී (ක්‍රි. ව. 459–477) දීප වංසය කියැ වූ බව (මහජනයා) ඇසෙන සේ, මහාවංසයේ සඳහන් වේ. අප රටේ පුරාවස්තු පමණක් නොව සමස්ත ජන උරුමයම රැකගත්තේ අප රටේ සංඝ සමාජය නායකත්වය ලබාදුන් රාජ්‍යත්වය හා සමීප සබඳතාවක් දැක්වූ එම සංවිධානාත්මක සමාජ සංස්ථාව මගින් බව මනාව පැහැදිලි වනු ඇත.



ක්‍රි. ව. 14 සියවස – මහනුවර ඇම්බැක්කේ ලී කැටයමක්

වාචික හා රූප සන්නිවේදනය මේ නිසා අද පමණක් නොව එද ද පැවති බව මේ අනුව පැහැදිලි වෙයි. මහාවංසය, දීපවංසය වැනි ග්‍රන්ථ පමණක් නොව පසුකාලීනව ලියැවුණු අමාවතුර, බුත්සරණ, ධර්මප්‍රදීපිකාව, දම්සරණ, සඟ සරණ, සද්ධර්ම රත්නාවලිය, පූජාවලිය, ජාතක පොත ආදී ග්‍රන්ථ සියල්ලම කියවනු අසා සිටීම සඳහා ලියන ලද ග්‍රන්ථයන් ය. ඒ අනුව ඒවා ශ්‍රව්‍ය මාධ්‍ය මගින් ජනතාවට සමීප කර වූ බව පැහැදිලි ය. විශේෂයෙන් ම ධර්ම දේශක රීතිය අනුව ලියැවුණු මෙම ග්‍රන්ථයන් අපගේ ජාතිය මෙතෙක් කල් පවත්වාගෙන ඒමට කළ සුවිශේෂ මෙහෙය අද අධ්‍යාපන ක්‍රමය මගින් සම්පූර්ණයෙන්ම අමතක කර ඇති බව ප්‍රකාශ කිරීමට සිදුවී ඇත. (ඒ ප්‍රශ්නය වෙනම සාකච්ඡා කළ යුත්තකි)

පැරණි යුගයේ දී විහාරස්ථානයකට කුඹුරු ආදිය පූජා කරන විට ඒවා භාරදීමේ සම්මත වත්පිළිවෙත් එකල දක්නට ලැබුණි. ඒ වත්පිළිවෙත් කලින් කල වෙනස් වූයේ ය. සමහරුන් තම පූජාව පිළිගැන්වූයේ 'සොවන බෙර පහරවය' රන්බෙරය නොහොත් ශ්‍රාවණය බෙරය ගසා එය ප්‍රසිද්ධියක් දීමෙන් වසුව ය.

මෙහි සොවන යන්නෙන් ස්වර්ණ හෙවත් රන් යන අරුත ප්‍රකාශ වන නමුදු පරණවිතාන මතය වී ඇත්තේ ශ්‍රාවණ හෙවත් අස්වන යන අර්ථයයි. මෙය ප්‍රසිද්ධ කිරීම සඳහා කරන ලද්දක් විය හැකි බව විද්වතුන්ගේ පිළිගැනීමයි. සොවන තොරතුරු කොට පිළිගැන්වූ බව ද ශිලා ලිපිවල සඳහන් වෙයි. සොවන කුනරනි දන අන වඩවය (රන් කෙණ්ඩියෙන් අත පැන් වත් කොට) භාර දුන්නේ ය යන්න එය අරුත ය.

පැරණි අපගේ සිංහල සංස්කෘතිය පිළිබඳ ඉගෙන ගන්නා විට අද අපගේ පැරණි පුරාවස්තු විනාශ කිරීම, කොල්ලකෑම, සොරකම් කිරීම, විකිණීම කෙතරම් නින්දිත පාපතර ක්‍රියාවක් ද යන්න පැහැදිලි වනු ඇත.

කිසියම් ප්‍රදානයක් ආගමික ආයතනයකට, විහාරයකට හෝ පන්සලකට දීමෙන් පසුව එම විහාර භූමියට ඇතුළුවීමට පවා රාජ්‍ය නිලධාරීන්ට තහනම් බව එම ප්‍රදානය සඳහන් කරන ගල් ටැඹේම සටහන් කර ඇත. එය පෙනෙන ස්ථානයක සිටුවනු ලැබේ.

ක්‍රිස්තු වර්ෂ 8, 9 වැනි හා 10 යන සියවස්වලට අයත් ලංකාවේ ටැම්ලිපි වැඩිකොටසක් අත්තාණි ලිපි ගනයට අයත් වේ. අත්තාණි යනු සභාශාලාව හෝ රාජ සභාවෙන් කළ සම්මුතිය යනුවෙන් හැඳින්විය හැක. එවැනි සම්මුති හා නියෝග පොදු ජනතාවගේ දැනගැනීම සඳහා ගල්ටැඹක එම කරුන සඳහන් කර එම භූමියෙහි පිහිටුවීම පැරණි සිරිතකි. එම ගල්ටැඹ පිහිටුවන්නේ ද රාජ්‍ය නිලධාරීන්ගේ ද සහභාගිත්වයෙනි. එවිට එම දීමනාව පිළිබඳ ජනතාව අතර ප්‍රසිද්ධියක් ද ඇති වේ.

මීට අමතරව අප ඉහතින් සඳහන් කරන ලද රූප මගින් සන්නිවේදනය කිරීමක් ද එම ගල් ටැඹ තුළින් සිදු කෙරුණි. එය සැබැවින්ම සංඝයා වහන්සේලාට කරන ලද එම පූජාව අමතකවී යාම වැළැක්වීමට පමණක් නොව එය විනාශ කරන්නන් සඳහා ද කෙරෙන සන්නිවේදනයකි.

දැනට සොයා ගෙන ඇති මෙවැනි අත්තාණි කණු රැසකම ඉර, සඳ, බල්ලු, කපුටු ආදී රූප දැකිය හැකි ය. මීට අමතරව මිටක් සහිත මණ්ඩලාකාර වස්තුවක් ද (වටාපතක් වැනි) බහු වක්‍ර රේඛා සටහනක් ද එම අත්තාණි කණුවල සටහන් කර ඇත.

ඉර සඳ රූප මෙම අත්තාණි කණුවල සටහන් කර ඇත්තේ එම දීමනාව ඉර – හඳ පවතිනාක් කල් හෙවත් බොහෝ කාලයක් පවත්වාගෙන යෑම සංකේතවත් කිරීම සඳහා ය. එම අදහස ප්‍රකාශ කරන පාඨයක් පවා සමහර අත්තාණි කණුවල සටහන් කර ඇත.

බල්ලු හා කපුටු රූප වලින් කෙරෙන්නේ ඉතා අගනා සන්නිවේදනයකි. මෙසේ සඟසතු කරන ලද පූජාවන් හෝ දීමනා කඩ කරන අය බල්ලන් කපුටන් වී මතු උපදින බව එයින් ප්‍රකාශ කෙරේ. මෙය රූපයෙන් පමණක් නොව වාචිකව ද සමහර අත්තාණි කණුවල දැකිය හැකි ය.

## පරණවිතාන සතුට පළ කළ හැටි



පොසොන් ඇසල ආදී උත්සවයන් හිදී වන්දනාකරුවන් හැර විශාල ජනකායක් පුරාවිද්‍යා තහනම් ඉඩම් කරා දිනපතා පැමිණෙති. මෙයට අවුරුදු දහසකට ඉහත සංචාරකයන් විසින් වැඩි සැලකිල්ලක් නොදැක්වූ සීගිරියට අද (1952) සෑම සති අගක දී දහස් ගණන් ජනයා පැමිණෙති. එසේම කලකට පෙර පුරාවස්තු ගැන උනන්දුවක් දක්වන වියතුන් ස්වල්ප දෙනෙකු ගේ පමණක් සැලකිල්ලට යොමු වූ මැදිරිගිරියට අද සෑම මසකම සිය ගණන් සංචාරකයෝ එති. බස් රථ පහසුවෙන් ගෙන යා හැකි ලෙස මැදිරිගිරිය පාර දියුණු කළහොත් දැනට වඩා සංචාරකයෝ එහි පැමිණෙතියි විශ්වාස කළ හැකි ය. පඬුවස් නුවර බැලීමට ද දිනපතා සැහෙන පිරිස් පැමිණෙති. පුරා විද්‍යා අධිකාරියේ වැඩ මෙලෙස සාර්ථක වනු දැකීම සතුටට කාරණයකි.

**(1952 වැන්නේ පුරා විද්‍ පුවත ආචාර්ය සෙනරත් පරණවිතාන).**

මේ කාරණය අද පුරාවස්තු විනාශ කරන පාපකාරී ජාති දූෂ්ට අධමයින්ට ඉතා අගනා පණිවිඩයක් සපයනු ඇත. පුරාවස්තු විනාශ කිරීම ද සංඝ භෝගය විනාශ කිරීමක් වැනි පාපකාරී ක්‍රියාවකි. හෙළා දැකිය යුතු ක්‍රියාවකි. එදා සංඝයාට පූජා කළ එම වතුපිටි හා ගම්බිම්, වැව් පොකුණු එසේම සඟසතුව පවත්වා ගැනීමේ අගය වටහා ගත් අපේ පැරණි මුතුන් මිත්තෝ ඒවා ගල්ටැම් වශයෙන් සකස් කර ජනතාවට පෙනෙන ස්ථානයක තැම්පත් කළේ ඒවා ආරක්ෂා කිරීමට එදා පැරණි සමාජය ඇප – කැපවී සිටි නිසා ය. අද අප ඒ ස්ථාන විනාශකිරීම කෙතරම් පාපකාරී ක්‍රියාවක් ද යන්න ගැන අටුවා ටීකා අවශ්‍ය නොවන්නේ ය. සඟසතු දේ විනාශකිරීම යනු ජාතිය සතු දේ විනාශ කිරීමයි. එසේම එදා එම විනාශය කරන පාපකාරී පුද්ගලයින් මතු භාවයෙහි බල්ලු – කපුටු වී උපත ලබන බව සඳහන් කිරීම නිසා සසර භය නිසාම ඔවුන් එයින් වැළකී ඇත. ඒ සඳහා දැඩි දඬුවම් එදා අවශ්‍ය නොවී ය. එහෙත් අද මිල මුදල පළමු තැනට පත්වී ඇති නිසා අප රටේ පුරාවස්තු රුපියල් සතවලට හුවමාරුවීමට එරෙහිව ඉතා දැවැන්ත සටනක් කළ යුතුව ඇත.

දැනටමත් මේ සඳහා සංස්කෘතික හා ආගමික කටයුතු ඇමතිවරයාගේත් පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේත් පොලිසියේත් අනෙකුත් ආරක්ෂක අංශ වලත් පූර්ණ සහභාගිත්වයෙන් පුරාවස්තු කොල්ලකරුවන් නීතියේ රැහැනට හසුකර ගැනීමේ කාර්යය ඉතා සූක්ෂම මෙන් ම කාර්යක්ෂමව ද සිදු කිරීම ජාතියේ භාග්‍යයකි. විශේෂයෙන් ම සංස්කෘතික හා ආගමික හා බුද්ධශාසන ඇමතිතුමාගේ ඉල්ලීම පරිදි ජනාධිපතිතුමිය විසින් නව පොලිස්පති තුමාගේ අවධානයට ලක්කර පුරාවස්තු කොල්ලකරුවන් සොරුන් පිළිබඳව සොයා බැලීමට පොලිසියේ ඒකකයක් පිහිටුවීම ඉතා කාලෝචිත කාර්යයකි. දැන් මේ පිළිබඳව ජනතාව විසින් ඔත්තු සැපයීම නිසා ඉතාමත් සාර්ථකව වැටලීම් කිරීමටත් ඔවුන් නීතියේ රැහැනට හසු කරගැනීමටත් අවස්ථාව සැලසී ඇත. එපමණකින්ම මෙම කාර්යය සර්ව සම්පූර්ණ යැයි අපි මොහොතකටවත් සිතිය යුතු නොවේ. නීති රීති හා දැඩි ආරක්ෂක සංවිධාන නිසා සොරුන් ද නව නවත් සංවිධාන ආකාරයෙන් මේ සොරකම් කිරීමට පෙළඹෙනු ඇත. පැලියගොඩ පොලිස් ස්ථානය විසින් වෙළඳ සැලකින් පුරා වස්තු සොයා ගැනීම ජනතාවගේ ප්‍රසංසාව ලැබිය යුතු ඉතා ශ්‍රේෂ්ඨ ක්‍රියාවක් සේ අපි සලකන්නෙමු. වෙස්වලාගෙන මෙසේ එම පුරා වස්තු කොල්ලකරුවන් අල්ලාගැනීම වැනි උපක්‍රම ඉදිරියේදීත් යොදා ගැනීමට ද සිදුවනු ඇත.

මෙම කටයුතු කෙටි කාලීන වශයෙන් වැදගත් වුව ද, දීර්ඝ කාලීන වශයෙන් ළමා හා තරුණ පරපුරට මේ අපගේ පුරා වස්තු, ජන උරුමය ගැන අවබෝධයක් ලබාදීම අද කළ යුතුව ඇති කාර්යයකි.

මේ යුගයේ ළමා පරපුර හා තරුණ පරපුර අප ගේ ඊළඟ පරම්පරාව වන නිසා ඔවුන්ට මෙහි ඇති අගය වටහාදීම කළ යුතු ය. එය කළ හැක්කේ පංති කාමරය තුළිනි. පංති කාමරය මේ දැනුම ගෙන ඒමට ප්‍රථම දීර්ඝ ක්‍රියාවලියක් ඒ සඳහා ක්‍රියාත්මක කළ යුතුව ඇත.

මූලික වශයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ප්‍රතිපත්තියක් ලෙසින් අප රටේ අතීත ජන උරුමය පිළිබඳ අවබෝධයක් ළමා පරපුරට ලබාදීම පිළිගත යුතුව ඇත. එසේම එය 1 ශ්‍රේණියේ සිට උසස් පෙළ දක්වා අනිවාර්ය කළ යුතුව ඇත. විද්‍යාව, කලා, වාණිජ ආදී කුමන විෂය ධාරාවක් හැදෑරුවත් තම රටේ ජන උරුමය පිළිබඳ ප්‍රශ්න පත්‍රයකට, උපාධි පරීක්ෂණ වලට පවා ඇතුලත් කළ යුතු ය. ඒ සමගම ඒ සඳහා ග්‍රන්ථ සම්පාදනය ගුරුවරුන් පුහුණු කිරීම ආදී ක්‍රියාදාමය ද කළ යුතු අතර ග්‍රන්ථ සම්පාදනයේ දී මෙතෙක් කල් අනුගමනය කළ වැඩ පිළිවෙලට අමතරව ඒ සඳහා පුරා විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව හා ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව යන ආයතන තුනේ පූර්ණ අනුග්‍රහය ලැබිය යුතුය.

මීට අමතරව පුවත්පත් මෙන් ම විද්යුත් මාධ්‍ය වලින් ද මේ පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීම ජාතික යුතුකමක් සේ සලකා ක්‍රියා කළ යුතුව ඇත.

මේ අනුව පුරාවස්තු විනාශ කරන, විකුණන, සොරකම් කරන පුද්ගලයින්ට එරෙහිව ක්‍රියා කිරීම පමණක් පුරාවස්තු රැකගැනීමේ කාර්යය සඳහා ප්‍රමාණවත් නොවන බව අවධාරණය කළ යුතුව ඇත. ❑